**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 07 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට මුද්දර ගාස්තු ණයගැති ගිණුමේ ප්‍රමාණයට වඩා, පෙර වර්ෂ වෙනුවෙන් ලැබුණු රු.1,024,491 ක මුද්දර ගාස්තු ආදායමෙන්, ආදායම් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීම වෙනුවට, මුද්දර ගාස්තු ණයගැති (හිඟ හිටි වෙනත් ආදායම්) ගිණුම හර කර, මුද්දර ගාස්තු ආදායම් ගිණුම බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය රු.1,024,491 ක් අඩුවෙන් ද, හිඟ හිටි වෙනත් ආදායම් ගිණුම රු.1,020,446 ක් වැඩියෙන් ද වර්ෂයේ ආදායම රු.2,044,937 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සභාවේ, දේපල පිරියත හා උපකරණ ගිණුම්වල ශේෂය සමඟ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ ගිණුම්වල ශේෂ එකතුව රු.27,142,721 ක් වුවද, ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.21,142,721 ක් වූයෙන් රු.6,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවති දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.5,142,806 ක් වුවද, එය රු.4,794,079 ක් ලෙස රු.348,727 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවති ශේෂයන් සමඟ උපයෝගී ලේඛනවල ශේෂයන් නොසැසඳීම් වටිනාකම වූ රු.1,536,500 ක්, නිවැරදි ශේෂ තහවුරු කර ගැනීමෙන් තොරව ජර්නල් සටහන් 14 මඟින් සමාලෝචිත වර්ෂයේ දී වත්කම් ගිණුම් බැරකර ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම හර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ලැබිය යුතු උසාවි දඩ ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබියදී, එම ප්‍රමාණයට වඩා ඉකුත් වර්ෂ වෙනුවෙන් වැඩිපුර ලැබීම් ලෙස ගණනය කරන ලද රු.73,885 ක උසාවි දඩ ආදායම් ජර්නල් සටහන් අංක 08 මඟින් සමාලෝචිත වර්ෂයේ දී ණයගැති ගිණුම හර කර, සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයේ දී සමුච්චිත අරමුදල් ශේෂය හා ණයගැති ශේෂය රු.73,885 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,113,985 ක් වුවද, එය රු.385,375 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.728,610 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලින් ඉදිරිපත් කරන ලද බිල්පතට අනුව ගෙවිය යුතු මුදල රු.1,663,285 ක් වුවද, එය ණයහිමියන් යටතේ රු.1,675,607 ක් ලෙස දැක්වීම නිසා බැරකම් රු.12,322 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුලදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ගැල්වනයිස් කොඩි කණු 472 ක වටිනාකම වූ රු.466,581 ක් සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම වූ රු.265,000 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.731,581 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

එක් ගිණුම් විෂයයකට අදාලව උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 407,736 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව ශේෂය රු. 1,869,314 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 35,307,064 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.32,410,966 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**
-----------------------------------

රු. 48,543,330 ක් වටිනා ගිණුම් විෂයයන් 07 ක් සඳහා උපලේඛන, ඔප්පු හා පිඹුරුපත් සහ විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**
----------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 1994 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාලය තුල අවස්ථා 21 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද රු.300,012 ක් වූ අත්තිකාරම් පියවා ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | සභාවේ සේවය කර, සේවය හැර ගිය සේවකයකුගෙන් 2005 වර්ෂයේ සිට අය නොවී පවතින රු.26,920 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර 29 ක් සම්බන්ධයෙන් මාසික බදු කුලිය ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන සේවයට අයත් තක්සේරුකරුවකු මඟින් තක්සේරු කරවාගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,706,937 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,172,420 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,534,517 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**
---------------------

2.21 **බදු කුලී**
--------

සභාව සතු කඩ කාමර 18 කින් අයවිය යුතු පැරණි කඩ කුලී හිඟ රු.547,922 ක් අයකර ගෙන නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.385,375 ක් හා මුද්දර ගාස්තු රු.3,481,400 ක් ලැබිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
------------------------------

3.1.1 කොන්ත්‍රාත් පාලනය
------------------------

කොස්ලන්ද වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගත් රු.5,000,000 ක ණය මුදල වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලට 2014 දෙසැම්බර් වන විට පොලී වශයෙන් රු.2,437,921 ක් හා ණය වාරික රු.1,233,329 ක් වශයෙන් එකතුව රු.3,671,250 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. වසර 05 ක පමණ කාලයක් ගත වුවද, මෙම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණු අතර, සභා අරමුදලින් පොලී ගෙවීමට සිදුවීම හේතුවෙන් සභාවේ මූල්‍ය තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවීමේ අවදානමක්ද පවතී.

### 3.1.2 **නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

--------------------------------------

2004 වර්ෂයේ දී ජෝන් ඩියර් ට්‍රැක්ටරය සමඟ ලැබී තිබූ නඟුල හා 252-6369 කැබ් රථයෙන් අවස්ථා දෙකකදී ඉවත්කරන ලද එන්ජින් 02 ක් නිශ්කර්යව පැවතුණි.

### 3.1.3 **හඳුනාගත් අලාභ**

------------------

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි කණු 472 න්, කොඩි කණු 192 ක් පමණක් ඉන්වෙන්ට්‍රිගත කර තිබුණු බැවින් රු.276,786 ක් වටිනා කොඩි කණු 280 ක් අස්ථානගත වී තිබුණි.

## 4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් පාලනය